# ශ්‍රීලාල්ගේ කොළම

## ප්‍රීතිමත්ම ආරංචිය

''සන්නස'' හා සම්බන්ධවීමෙන් පස් වසරකට පසු මා ලද ප්‍රීතිමත්ම ආරංචිය ලැබුණේ ඉකුත් ජනවාරියේය. ඒ සන්නස ජනවාරි කලාපයේ සමුදි පිළිබඳ මා තැබූ සටහන කියවූ කාරුණික හදවතක් ඇති පාඨක මහත්මයෙක් ඇයට ආධාර කරන්නට ඉදිරිපත්වී ඇති බව දැනගන්නට ලැබීමයි. මට ඒ බව දන්වා තිබුණේ සන්නස උපදේශක කර්තෘ ජගත්ය. ඒ මොහොතේ මට ඇතිවූයේ සිද්ධාර්ථ සිඟිත්තා දැකබලා ගත් අසිත තාපසතුමාට ඇතිවී යැයි බොදු සාහිතේ එන හැඟීම් සමාන හැඟීම්ය.
මුලින්ම සොම්නසය.
දෙවනුව දොම්නසය.

සොම්නස ඇතිවූයේ අසරණ සමුදි වෙනුවෙන් සරණක් සැළසෙන බව අසන්නට ලැබුණු බැවිනි. දරිද්‍රතාවයේ පත්ලේ සිටින සමුදිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වරම් ලැබී තිබුණද ඒ සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා ටිකවත් සපයාගත නොහැකිව තිබියදී ඈ පිළිබඳ මා තැබූ ලඝු සටහන කියවා බැලූ එක් කාරුණික හදවතක් ඇති මහතෙක් ඇය ගැන තොරතුරු විමසා තිබිණ. මා අසා ඇති පරිදි ඕස්ට්‍රේලියාවේ ජීවත්වන ලංකිකයන් සංඛ්‍යාව හැට දහසකට ආසන්නය. අඩුතරමින් හතලිස් දහසක්වත් සන්නස පාඨකයන් විය හැකිය. ඒ අතරින් එක් අයෙකුගේ හෝ හදවත තමන් උපන් රටේ වෙසෙන අසරණියක වෙනුවෙන් උණුවී තිබේ. සොම්නස ඒ පිළිබඳවය. දොම්නස ඇතිවූයේ තමන් උපන් රටේ අසරණව සිටින තවත් කොතෙකුත් සිටියත් ඔවුන් වෙනුවෙන් උණුවන හදවතක් ''සන්නස'' පාඨකයන් අතරින් හෝ එදා-මෙදා තුර මට හමු නොවීම පිළිබඳවය. එදා යනු මම සන්නසට ලියන්නට පටන්ගත් දාය. නිශ්චිතවම දිනය මතකයෙහි නැතත් මම පළමුවෙන්ම සන්නසට ලිපියක් ලීවේ අඩුතරමින් මීට වසර හයකටවත් ඉහතදීය. එතැන් සිට අඛණ්ඩව අද දක්වා මම සන්නසට ලියමි.

ඒ කාලය තුළ උපන් බිමේ වෙසෙන අසරණයන් සැළකිය යුතු සංඛ්‍යාවක් පිළිබඳ තොරතුරු ලියා ඇත. එහෙත් ඒ එකම තොරතුරකටවත් සන්නස පාඨකයන්ගෙන් කවරාකාර හෝ ප්‍රතිචාරයක් පළවී නොමැත.

මගේ මාධ්‍ය ජීවිතය මේ වන විට විසිහත්වෙනි වසරටද පා තබා තිබේ. එදා මෙදා තුර මම මාධ්‍ය ආයතන ගණනාවකට සම්බන්ධවී කටයුතු කර ඇත. ඒ සෑම අවධියකදීම මම ප්‍රමුඛත්වය දුන් එක්තරා අංගයක් වූයේ මාධ්‍ය භාවිතය තුළින් අසරණයන්ට යම් පිහිටක් ගෙනදීමය. ''දිවයින'' පුවත්පතේ ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස 1988 වසරේ මාධ්‍ය ජීවිතය ඇරඹූ මම මුල් අවධියේම කෑගල්ල දේවාලේගම ප්‍රදේශයේ දුප්පත් පාසල් දරුවකු පිළිබඳ දිවයිනට වාර්තාවක් සැපයුවෙමි. ඒ පිළිබඳ පැහැදිලි මතකයක් අද මා සතුව නැත. එහෙත් මේ වාර්තාව පත්තරේ පළවීමෙන් පසු සිදුවූ දේ නම් එදා මෙන්ම අදටත් මතකය. පුවත පලවී සතියක් ගතවන්නටත් පෙර එවක දිවයින කර්තෘ එඩ්මන් රණසිංහ මහතා හදිසියේම මා දිවයින කාර්යාලයට කැඳවීය. පුවතේ කියැවුණු පාසල් සිසුවා ඔහුගේ දෙමාපියන් සමඟ දිවයින කාර්යාලයට කැඳවාගෙන පැමිණිය හැකිදැයි රණසිංහ මහතා මගෙන් විමසුවේය. ඒ අනුව දින කීපයකට පසු යම් දිනෙක මම දෙමාපියන්ද සමඟ සිසු දරුවා කැටුව දිවයින කාර්යාලයට පැමිණියෙමි.

අපි රණසිංහ මහතාගේ වීදුරු කාමරයට ඇතුළුවන විට එහි කාන්තාවක් ප්‍රමුඛ තවත් කිහිපදෙනෙක් සිටියහ. කාමරය පසෙක විශාල ප්‍රමාණයේ පාර්සල් සහ පෙට්ටි රාශියක් ගොඩගසා තිබුණි. ඒ සියල්ල සිසුවාගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ලැබුණු පරිත්‍යාගය. අඳුම්-පැළඳුම්, පොත්-පත් පමණක් නොව කෑම බීමද එහි විය. රැස්කර ගෙනවිත් තිබුණේ කාමරය තුළ සිටි ආගන්තුක පිරිසය. මේ තෑගි බෝගවලට අමතරව යම් මුදලක්ද සිසුවාගේ දෙමාපියන් අතට පත්විය. අද වන විට මට ඒ දරුවා ගැන මෙන්ම ඒ දරුවාට මා ගැනද කිසිදු මතකයක් නොමැති බව නිසැකය. එහෙත් වසර විසිපහකට පමණ පෙර සිදුවූ මේ සිදුවීම තවමත් චමත්කාර ජනක සිතුවමක් සේ මසිත රැඳී තිබේ.

ඉන් පසු අවස්ථා රාශියකදී ඒ අයුරින් මම මගේ ''පෑනෙන්'' ඉගෙන ගන්නා වයසේ අසරණ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් සැළකිය යුතු දායකත්වයක් ලබාදීමට සමත්වී ඇත්තෙමි. ඒ සියල්ල මතකයෙහි පවා නොමැත. මතකයේ ඇති කීපය පවා මෙහි සටහන් කිරීමට අදහස් නොකරමි. ඒ අතරින් තවත් අමතක නොවන සිදුවීමක් පමණක් මෙහි සටහන් කරමි.
දිනක් මහමගදී අනපේක්ෂිත ලෙස හමුවූ එක් කුඩා දැරියකගෙන් තොරතුරු විමසන විට ඇය පැවසුවේ සිත කම්පා කරවන කතාවකි. පියා නොමැති පවුලක තුන්වෙනි ගැහැණු දරුවා වූ ඇය අතිශය දුෂ්කර පාසල් ගමනක යෙදී පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වී තිබිණ. එමගින් ජනප්‍රිය පාසලකට ඇතුළත්වීමේ දුර්ලභ අවස්ථාව ඇයට ලැබී තිබුණද කුලී වැඩ කර දරු පවුලක් නඩත්තු කරන මවට දරුවා වෙනුවෙන් ඒ අවස්ථාව ලබාදෙන්නට හැකි ආර්ථික තත්ත්වයක් නොවීය. එබැවින් ශිෂ්‍යත්වය සමත් සෙසු දරුවන් ජනප්‍රිය පාසල්වලට ඇතුළත්වී තිබුණද මේ දරුවාට ගමේ දුෂ්කර පාසලේම නතරවන්නට සිදුව තිබුණි.

ඒ පිළිබඳ සටහනක් මම එවක සේවය කළ ''රාවය'' පුවත්පතේ පළ කළෙමි. ඒ පුවතට ලැබී තිබුණු ප්‍රතිචාරය ඉහළය. ඉතාලිය, ඕස්ට්‍රේලියාව සහ සෞදි අරාබිය යන රටවල් තුනෙන් කාරුණික මහත්වරුන් තුන් දෙනෙක් ඇය වෙනුවෙන් ආධාර කරන්නට ඉදිරිපත් වූහ. ඒ ආධාර ලබාගෙන ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කරගන්නට අවශ්‍ය පසුබිම සකස් කිරීමට මමද දායක වුණෙමි. එතැකින් නොනැවතුනු මා කැකිරාව කලාපය භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට කතා කර ඇය කැකිරාව මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කිරීමටද පියවර ගත්තෙමි.

මේ ආකාරයටම සමාජයේ විවිධාකාර අසරණයන් බොහෝ දෙනෙකු පිළිබඳ රටට හෙළිකිරීම මම උනන්දුවෙන් සිදුකරගෙන ගිය අතර බොහෝ අවස්ථාවල ඒවාට යහපත් ප්‍රතිචාරද ලැබුණි. ''සන්නස''ට සම්බන්ධවන විට මම සිතුවේ මගේ මේ ''අසරණ සරණ සේවය'' පිම් කීපයක් ඉදිරියට ගෙන යා හැකි වනු ඇති බවය. මන්ද ඕස්ට්‍රේලියාවේ සිටින ලාංකේය ප්‍රජාව සෑම අතින්ම ලංකාවේ සිටින ''අසරණයන්ට'' වඩා සෑම අතින්ම ගව් ගණනක් ඉහළින් සිටින බවට තක්සේරුවක් මා තුළ වූ බැවිනි. එබැවින් මම බොහෝ විට අසරණයන් පිළිබඳ කෙරෙන අනාවරණයන් විවිධාකාරයෙන් මගේ ලියවිලි තුළට ඇතුළත් කළෙමි. එහෙත් ඒ එකම අනාවරණයකටවත් (මා දැනුම්වත්ව) කිසිදු පාඨක ප්‍රතිචාරයක් ලැබී නොතිබිණ. මතකයෙහි ඇති අවස්ථා දෙකක් පමණක් මෙහි ලියමි.

හරූන් ලන්ත්‍රා සහ ජේ එච් ජයවර්ධන යන කලාකරුවන් පිළිබඳ මා සන්නසට ලියුවේ ඔවුන් දෙදෙනාම වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට පවා වත්කමක් නොමැතිව ගිලන් ඇඳ හොත්ව සිටියදීය. ජේ එච්ට ආයාශයකින් හෝ කතා කරන්නට හැකියාව තිබුණද හරූන් ලන්ත්‍රාගේ හඬ මුළුමනින්ම ගොලුවී තිබිණ. හරූන් වෙනුවෙන් කතා කළේ ඔහුගේ බිරිඳය. මේ දෙදෙනාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදලක් හෝ ලැබෙන්නේ නම් විශාල සහනයක් බව පවසා සිටි අතර මම ඒ බව සන්නසෙහි සටහන් කළෙමි. ඉන් මාස කීපයකට පසු මම යළිත් මේ දෙදෙනාට දුරකථන ඇමතුම් ගත්තෙමි. ආධාරයක් තබා තොරතුරු විමසීමක්වත් කිසිවෙකුගෙන් සිදු නොවූ බව එවිට දැනගන්නට ලැබුණි.

සමුදි පිළිබඳ තොරතුරු විමසීමට හෝ එක් මහත්මයකු හෝ ඉදිරිපත්වීම සන්නසෙන් මා ලද ප්‍රීතිමත්ම ආරංචිය වන්නේ එබැවිනි.




අයි.ජී.එච්. සමුද්‍රිකා තෙන්නකෝන්
අලුත් වැව,
බඹරගස් වැව,
ගලේවෙල
2014-01-22

සංස්කාරක තුමා,
'සන්නස' පුවත් සංඟරාව
මෙල්බන්
ඕස්ට්‍රේලියාව

ඔබ තුමන් විසින් මාගේ සවිස්තරාත්කම තොරතුරු ඉල්ලා කරන ලද දැනුම් දීමට පිළිතුරු සපයමින් මෙම ලිපිය ලියමි.



ඉහත නම සහ ලිපිනය සඳහන් මම මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික් සීමාවේ අළුත්වැව නම් පිටිසර ගමේ ජීවත් වන 2012 වර්ෂයේදී විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලද තරුණියක්මි. මා හට වයස අවුරුදු දහතුන වෙද්දී මාගේ පියා හදිසියේ රෝගාතුර වී අකල් මරණයකට පත්විය. එතැන් පටන් මාගේ මව කුලී වැඩ කරමින් ඉතා දුක සේ මා හදාවඩා ගත්තාය. බොහෝ ආර්ථික දුෂ්කරතා හා අඩුපාඩු මැද මම ගමේ පාසලට ගොස් අධ්‍යාපනය හදාරා 2009 දී සාමාන්‍යපෙළ විභාගයට පෙනී සිට විද්‍යාලයේ ඉහළම ප්‍රතිඵලය ලෙස ''3ල ඊ 5ල ඝ 1 සාමාර්ථයක් ලබාගතිමි. ඒ ප්‍රතිඵලය අනුව පහසුවෙන් මා හට ගණිත හෝ විද්‍යා අංශයෙන් උසස් පෙළ හැදෑරීමට මට හැකියාව තිබුණි. එහෙත් ඒ සඳහා පහසුකම් සහිත පාසලකට ගොස් අධ්‍යාපනය කරගෙන යාමට තරම් ආර්ථික හැකියාවක් නොතිබූ බැවින් මට ගමේ පාසලේම සිට කලා අංශයෙන් උසස් පෙළ හැදෑරීමට සිදුවිය.

2012 වසරේ උ:පෙළ විභාගයට පෙනී සිට සිංහල හා ආර්ථික විෂයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ දෙකක් ද භූගෝල විද්‍යාව විෂය සඳහා අධි සම්මාන සාමාර්ථයක් ද ලබා ගතිමි. ඒ අනුව අප විද්‍යාලයේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලද එකම ශිෂ්‍යාව ලෙස 2012/2013 අධ්‍යන වර්ෂය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට තෝරා ගැණුනි. ඒ අනුව ඉකුත් 2014-01-12 දින එම විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ලියාපදිංචි වුණෙමි.

මේ සාර්ථකත්වය මා ලැබුයේ දීර්ඝකාලයක් තිස්සේ අසනීපව සිටින මාගේ මව එදිනෙදා කුලී වැඩ කර උපයා දුන් මුදලිනි. කුඩා පොල් අතු පැලක සිට කුප්පි ලාම්පු එළියෙන් පාඩම් වැඩ කරමිනි. එවැනි දහසකුත් එකක් දුෂ්කරතා මැද විශ්ව විද්‍යාල ප්‍රවේශ වරම් ලැබුවද එම අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමද ඉතාම දුෂ්කර කටයුත්තකි.

එම ගැටළුවලට විසඳුම් පෙනෙන තෙක් මානයක නොවූයෙන් අධ්‍යාපන කටයුතු අතහැර දැමීමට පවා වරෙක මට සිත් විය. එහෙත් කෙසේ හෝ මෙම අභියෝගය ජය ගැනීමේ අරමුණින් නැවත අධ්‍යාපන කටයුතු කිරීමට තීරණය කළෙමි. එසේ සිතා විශ්ව විද්‍යාලයට ඇතුළත් වීම සඳහා අවශ්‍ය මූලික වියදම් පියවා ගැනීමට මුදල් සොයා මාස හතරක කාලයක් කුරුණෑගල ප්‍රදේශයේ ඇඟළුම් කම්හලක සේවයට ගියෙමි. ඉන් ලද වැටුපෙන් රු. 16,000ක් පමණ ඉතිරි කර ගතිමි.

විශ්ව විද්‍යාල ප්‍රවේශයට අළුතින් හඳුන්වා දුන් නායකත්ව පුහුණුව ආදී කටයුතු සඳහා එයින් කොටසක් වියදම් විය. ඉන් පසු අම්මා සහ මා සතුව තිබූ එකම වත්කම වූ අක්කර කාලක ඉඩම රු. 25,000ක මුදලකට උකස් කර එම මුදල ද මාගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යොදා ගැණුනි.

එසේ වුවද ඉදිරි වසර තුනක හෝ හතරක කාලයක් අඛණ්ඩව එම අධ්‍යාපන කටයුතු කරගෙන යාමට මට ඇති හැකියාව අවිනිශ්චිතය.

**(සමුද්‍රිකාගෙ දිග ලිපියෙන් කොටසක් අපි ඉවත් කළ බව සළකන්න - සංස්කාරක සන්නස)**

එබැවින් මගේ අධ්‍යාපනය උදෙසා යම් පරිත්‍යාගයක් කළ හැකි මහත්මය හෝ මහත්මාවක සම්බන්ධ කර දීමට සන්නස පුවත්පත දක්වන අනුග්‍රහය පිළිබඳව මගේ හදපිරි ස්තූතිය පිරිනමමි

හිතවත්

සමුද්‍රිකා

**සමුද්‍රිකාගෙ අධ්‍යාපනය වෙනුවෙන් යම් සහයෝගයක් දෙන්න කැමති එක් අයෙක් හෝ අප අතර ඉන්න පුලුවන්. රුපියල් විසිපන්දහසකට තමන්ට කියා තිබුණ එකම කුඹුරත් උගස් කර සරසවියට යන්න වෙර දරන මේ දිරිය දියණියට අත දෙන්න ඔබට පුලුවන්. ඔව් එහෙම කෙනෙක් ලෝකේ කොතනක හරි ඉන්න පුළුවන්. තවමත් ඇයට හමු නොවුණ ඒ පරිත්‍යාගශීලියා ඔබ වෙන්න පුළුවන්**

**සමුද්‍රිකාට විශ්වවිද්‍යාලයට යන්න මූලික අවශ්‍යතා ටිකවත් අරන්දීලා අත්වැලක් වෙන්න ඔබට පුළුවන් නම් කතා කරන්න. මෙන්න ඇයගේ දුරකථන අංකය. 94 771420498**